ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No. 2323730

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail cabsecsl@sltnet.lk

වෙබ් අඩවිය
வெப் தளம்
Web Site www.CabinetOffice.gov.lk

**<u>හදිසි හා වැදගත්</u>**

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

ජනරජ චතුරස්‍රය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

குடியரசுச் சதுக்கம், சேர் பாரோன் ஜயதிலக்க
மாவத்தை, கொழும்பு 01.

Republic Square, Sir Baron Jayathilaka
Mawatha, Colombo 01.

මගේ අංකය
எனது இல.
My No. CA/M/Sub/Co/E/1(v)

ඔබේ අංකය
உமது இல.
Your No.

**2010 මැයි මස 02 දින.**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**අමාත්‍යාංශවලට පත්කරනු ලැබ සිටින උපදේශකවරුන්ගේ/විචාර්යවරුන්ගේ**
**<u>සේවා කාලය සීමා කිරීම</u>**

අමාත්‍යාංශවල ක්‍රියාත්මකවූ විවිධ වැඩ සටහන් සඳහා එම අමාත්‍යාංශ භාර ගරු අමාත්‍යතුමන්ට සහ අමාත්‍යාංශවලට අවශ්‍ය සුවිශේෂ උපදෙස් ලබාදීම පිණිස, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, උපදේශකවරුන් සහ විචාර්යවරුන් සීමිත සංඛ්‍යාවක් විටින් විට පත්කරන ලදී.

02. 2010 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමත්, 2010 පාර්ලිමේන්තු මැතිවරණය පවත්වා නව අමාත්‍ය මණ්ඩලයක් පත්කිරීමට නියමිතව තිබීමත් මත, 2010 ජනවාරි මාසයෙන් පසුව කරන ලද එබඳු පත්කිරීම්වල සේවා කාලය 2010 අප්‍රේල් මස 30 දිනට සීමා කරන ලද වුවද, 2010 ජනවාරි මසට පෙර සිදු කරන ලද ඇතැම් උපදේශකවරුන්ගේ/විචාර්යවරුන්ගේ පත්කිරීම්වල සේවා කාලය එම දිනය ඉක්මවා ක්‍රියාත්මක වීමට නියමිත බව පෙනීගොස් ඇත.

03. දැන් නව අමාත්‍ය මණ්ඩලයක් පත්කරනු ලැබ ඇති අතර, අමාත්‍යාංශ සංඛ්‍යාව ද අඩු කරනු ලැබ තිබේ. මේ අනුව, නව අමාත්‍යාංශවලට පවරනු ලැබූ විෂයයන් සහ කාර්යයන් සඳහා උපදේශකවරුන්/විචාර්යවරුන් පත්කිරීමේ අවශ්‍යතාව, අලුතින් පත්කරන ලද අමාත්‍යවරුන් විසින් සමාලෝචනය කළ යුතුව ඇත. එබැවින්, දැනට එකී අමාත්‍යාංශවල සේවයේ යෙදී සිටින උපදේශකවරුන්ගේ/විචාර්යවරුන්ගේ සේවය 2010 අප්‍රේල් මස 30 දිනෙන් ඔබ්බට අවශ්‍ය නොවන බව අතිගරු ජනාධිපතිතුමාගේ අදහස වී ඇත.

04. මේ අනුව, ඔබ අමාත්‍යාංශයට අනුයුක්තව සිටින, සිය සේවා කාලය 2010 අප්‍රේල් 30 දිනෙන් ඔබ්බට ක්‍රියාත්මක වන උපදේශකවරුන්ගේ/විචාර්යවරුන්ගේ සේවය, ඊට අදාළ පත්වීමේ ලිපියේ සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කරමින්, එදින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කරන ලෙස කාරුණිකව දන්වමි. ද්විතීයන පදනම මත පත්කරනු ලැබ සිටින උපදේශකවරුන්/විචාර්යවරුන් 2010 මැයි මස 01 දින සිට ඔවුන් කලින් සිටි ආයතනවලට ආපසු යැවිය යුතුය. ඉහත සඳහන් පදනම මත සේවය අවසන් කර ඇති උපදේශකවරුන්ගේ/විචාර්යවරුන්ගේ ලැයිස්තුවක් 2010 මැයි මස 07 වන දිනට හෝ ඊට පෙරාතුව ලැබෙන සේ ෆැක්ස් පණිවිඩයක් මගින් (ෆැක්ස් අංක 2323730) මා වෙත කරුණාකර එවනු මැනවි.

05. ෆැක්ස් පණිවිඩයක් මගින් ඉංග්‍රීසි භාෂාවෙන් ඔබ වෙත එවන ලද 2010 අප්‍රේල් 30 දිනැති මාගේ ලිපිය වෙනුවට, කරුණාකර මෙම ලිපිය ආදේශ කරගනු මැනවි.

එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

පිටපත්:
* ජනාධිපති ලේකම්
* අග්‍රාමාත්‍ය ලේකම්
* භාණ්ඩාගාරයේ ලේකම්
* විගණකාධිපති